# නාට්‍යය යනු කුමක්ද?

නාට්‍යය යනු කුමක්දැයි ඔබගෙන් යමෙක් ඇසුවොත් ඔබ දෙන පිළිතුර කුමක් ද? කිසියම් රඟහලක රඟ දක්වන කිසියම් හෝ කලා නිර්මාණයක් නාට්‍යය යයි ඔබ හඳුන්වනු නියත ය. තව කෙනෙක් පුස්තකාලයක හෝ තමන් ළඟ තිබෙන මුද්‍රිත නාට්‍ය පිටපතක් නාට්‍යය ලෙස හැඳින්වීමට ඉඩ ඇත. රඟ හලක වේදිකා ගත කළ පමණින් එය නාට්‍යය ය යන නිර්වචනය තුළට ගත හැකි නිර්මාණයක් වේ ද? නැතහොත් මුද්‍රිත පෙළ නාට්‍යයක්ද?

යම් පොතක නාට්‍ය පිටපතක් අඩංගු වූ පමණින් එය නාට්‍යයක් වන්නේ නැත. නාට්‍ය පිටපතක ඉලක්කය එක් රසිකයෙකි. එය කියවන්නේ තනි පුද්ගලයෙකි. එම පාඨකයා නිවසේ හෝ බස් රියේ දුම්රියේ පුස්තකාලයේ දී තමන්ට ඉඩ ලැබෙන අයුරින් හුදකලාව එම නාට්‍ය පිටපත අඩංගු පොත කියවනු ලබයි. එසේ වුව ද එහි ඇති සංවාද තුළින් මතු වන්නේ නාට්‍ය රසයක් නොව සාහිත්‍ය රසයකි. තමා මවා ගන්නා භූමිකාවක් තුළ තමන්ගේ සිතට දැනෙන රූපාවලියක් චිත්ත රූප බවට පරිවර්තනය කර ගනියි. මෙහිදී තමන්ගේ පෞද්ගලික අත්දැකීම් වින්දන ශක්තිය භාෂා ඥානය  සංවේදීතාව යන කරුණු මත නාට්‍යයේ අත්දැකීම් විඳගනියි. එහෙත් එම පාඨකයා ප්‍රේක්ෂකයෙකු නොවේ. ඔහු ලබන්නේ නාට්‍ය පිටපතේ ඇති සාහිත්‍ය රසයයි. එයට හේතුව වන්නේ කියවන විට චරිත නිරූපනය වන සේ හෝ නාට්‍යමය අවස්ථා ගොඩනැගීමට සමත් සංවාද කියවන විට වේදිකාව මත දකින විටදී මෙන් චරිත වල සජීව චර්යාවන් සිතන පතන දේ හඳුනා ගැනීමට පාඨකයාට ඉඩ නොලැබේ.

එමෙන්ම නලුවන් කීප දෙනෙකු වේදිකාවක් මත නැග එක් එක් චරිතයට අදාල දෙබස් කියූ පමණින් එයද නාට්‍යයක් වන්නේ නැත. ඔවුන් නලුවන් වන්නේ ද නැත. නාට්‍ය පිටපතක ලියවුණු යකැදුරෙකුගේ චරිතයක් නිරූපනය කරන නලුවෙකු ඔහුගේ ස්වරූපය දැනවෙන ආකාරයට රංග වස්ත්‍ර ඇඳගනියි. ගමන් විලාසයක් අනුකරණය කරගනියි. එය නාට්‍ය ජවනිකාවක් නම් දෙබස් උච්ඡාරණයේ දී නලුවා යකැදුරාට ආවේනික බස් වහරක් උච්ඡාරණය කිරීමෙන් රසයක් මතු කිරීමට උත්සාහ ගනියි. එමෙන්ම එම චරිතයේ ඇති මනුස්ස ස්වභාවය හැඟීම් සිතුවිලි ආදිය පළවන සේ මසින් ලෙයින් සැදුණු සැබෑ මිනිසෙකුගේ අධ්‍යාත්මයත් බාහිර ස්වරූපයත් අපට දැක ගැනීමට හැකි වන සේ නලුවා විසින් වේදිකාව මත එම භූමිකාව නිරූපනය කරනු ලැබේ. මෙයින් අපට පෙනෙනේනේ නාට්‍යය යනු දෘෂ්‍ය කාව්‍යයක් ය යන්නය. එබැවින් මා මුලින් සඳහන් කළ පරිදි වේදිකාව මත නැග දෙබස් කියූ පමණින් එය නාට්‍යයක් නොවන්නේ මන්දැයි ඔබට පැහැදිලි වනු ඇත.



නාට්‍යයක් ගද්‍යයෙන් ලියුව ද පද්‍යයෙන් ලියුව ද ශෛලි ගත වුව ද යතාරථවාදී වුව ද නිර්මාණාත්මක රසය වර්ධනය වන කාව්‍යමය ලක්ෂණ එම නාට්‍ය පෙළේ අන්තර්ගත වී ඇත්නම් කුමන ශෛලියකට අයත් වුව ද එය දෘෂ්‍ය කාව්‍ය ගණයෙහි ලා සැළකේ.



ශ්‍රීනාත් මද්දුමගේ

එසේ නම් රචකයා කරන්නේ කුමක් ද? නාට්‍ය රචකයාගේ සිතේ ඇඳෙන කතාවක් වචන තෝරාගෙන වාක්‍ය ලෙස නොව සංවාද ලෙස ගලපා එම සංවාද වේදිකාව මත දී නලු නිලියන් ලවා නිරූපනය කිරීමට උචිත සංවාද ලෙස පෙළ ගැස්වීමෙන් නාට්‍යයක් රචනා කරයි. නවකතා කරුවා ට සිය නිර්මාණය ගොඩ නැගීමට ඇති ඉඩ කඩ අති විශාලය. සීමාවන් අල්පය. එහෙත් නාට්‍ය කරුවා තම ප්‍රකාශණ මාධ්‍යය නාට්‍යයක් ලෙස තෝරාගත් අවස්ථාවේ සිටම එම කලා මාධ්‍යයට ආවේනික සීමාවන් රැසක් ඔහු හමුවට එයි. නාට්‍ය රචකයා තමා ලියන්නේ කුමන ශෛලිගත නාට්‍යයක් ද අධි ශෛලිගත නාට්‍යයක් ද ස්වභාවික යථාර්ථවාදී ද ගීත නාටකයක් ද මුද්‍රා නාටකයක් ද අසම්මත නාට්‍යයක් ද යනුවෙන් ඔහු අනුගමනය කිරීමට යන ශෛලිය තෝරා ගත යුතුය. හැකි නම් ඉහත සඳහන් කළ කිසියම් ශෛලියකට අයත් හෝ කිසියම් ශෛලියකට අයත් නොවන හෝ ඔහුගේම ශෛලියකට නිර්මාණය කළ හැකි ය. නමුත් නාට්‍ය රචකයා තම ශෛලිය නිශ්චිතව තීරණය කොට ගත යුතු ය. එමෙන්ම නාට්‍යයේ චරිත සංඛ්‍යාව මෙම නාට්‍යය කුමන රංග භූමියක් මත වේදිකා ගත කිරීමට උචිත ද කතා වින්‍යාසය ගොඩ නැගීමේ දී නාට්‍යමය අවස්ථා හා ගැටුම් ඉස්මතු වන සේ පෙළ රචනා කරන්නේ කෙසේ ද සජීවී බව පසුතල නිර්මාණය රංග වස්ත්‍ර රංග භූමිය යන සියලු කරුණු කෙරෙහි සිත යොමු කළ යුතුය.



## කෙටි නාට්‍යයක් යනු කුමක් ද?

කෙටි නාට්‍යයක් යනු දිග නාට්‍යයක කොටසක් නොව මුල මැද අග සහිත සම්පූර්ණ නාට්‍යයක් විය යුතුය. සමහර විට කෙටි නාට්‍යයක එක දර්ශණයක් පමණක් තිබිය හැකි ය. නැතිනම් දර්ශණ කීපයක් තිබිය හැකි ය. නමුත් නාට්‍ය රචකයා චරිත ගැන මැනැවින් සිතිය යුතුය. සෑම මොහොතකම චරිතයෙන් ලබා ගත යුතු දේ හරියාකාරයට ලබා ගත යුතු ය. තමා නිර්මාණය කරන චරිත පීඩනයකට ලක් කොට උපරිම රංගනය ලබා ගැනීම අධ්‍යක්ෂ වරයාගේ වගකීමකි. එමෙන්ම කෙටි නාට්‍යයක් තුළ සෑම චරිතයකටස කුමක්හෝ කාර්ය භාරයක් තිබිය යුතු ය. යම් චරිතයක් විසින් කළ යුතු දේ වෙනුවට වෙනත් දෙයක් කරන චරිත එම නාට්‍යයේ නොතිබිය යුතු ය. කෙටි නාට්‍යයකදී විශේෂයෙන් ම නලුවන් අතර අන්තර් සබඳතා තබා ගැනීම ඉතාමත් වැදගත් ය. එයට හේතුව වන්නේ සීමිත කාලයක් තුළ නාට්‍යයේ අන්තර්ගතය ප්‍රේක්ෂකයා ග්‍රහණය කරගත යුතු බැවිනි. කෙටි නාට්‍යයකදී අපතේ යැවීමට කාලයක් නැත. එමෙන්ම වචන වල අර්ථය නිරීපනය වන පරිදි පැහැදිලිව ශබ්ද කිරීමට තමන්ට හැකියාවක් තිබිය යුතු ය.

කෙටි නාට්‍යයකදී එකම දේ නැවත නැවත කිරීමට කාලයක් නැත. එමෙන්ම එසේ වූ විට ප්‍රේක්ෂකයා නාට්‍ය කෙරෙහි ඇති බැඳීමෙන් ගිළිහී යාමට එය හේතු වෙයි. කෙටි නාට්‍යයක් කාලීන හෝ සර්ව කාලීන විය හැකි ය. තාත්වික නාට්‍යයක් නම් පිටපත කාලීන විය යුතුය. උදාහරණයක්ෙ ලෙස 80 දශකයේ අප දුටු ටෙලිවිෂන් යන්ත්‍රය ගැන සිතුවහොත් එය වර්තමානයට කාලීන පුවතක් නොවිය හැකි ය. කෝලම් සම්ප්‍රදායට අනුකූලව නාට්‍යක් ඉදිරිපත් කරන්නේ නම් එම සම්ප්‍ර(දායට හානියක් නොවන අයුරින් එය ඉදිරිපත් කළ යුතු ය. නැතහොත් ඉන් ආභාෂය ගෙන නව නිර්මාණයක් ඉදිරිපත් කළ හැකි ය.



කෙටි නාට්‍යයක තිබිය යුතු වැදගත්ම ලක්ෂණය වන්නේ නාට්‍ය කරුවා විසින් ඉදිරිපත් කරන පණිවුඩය කුමක් ද යන්න ප්‍රේක්ෂකයාට පැහැදිළි විය යුතු වීමයි.

එමෙන්ම නාට්‍යයක කූඨ ප්‍රාප්තිය ප්‍රේක්ෂකයාට දැනුණ පසුව නාට්‍යය තව දුරටත් ඇදී යාමට ඉඩ නොදීම නාට්‍ය කරුවාගේ වගකීමයි. මේ අයුරින් නාට්‍යයක තිබිය යුතු ලක්ෂණ මෙන්ම කෙටි නාට්‍යයක අන්තර්ගතය පිලිබඳව සාකච්ඡා කිරීම මා පෙළඹවූයේ කෙටි නාට්‍යයක් නිර්මාණයේ දී සැළකිලිමත් විය යුතු කරුණු පිලිබඳව නාට්‍ය කරුවන් දැනුවත් කිරීමේ අරමුණෙනි.

අවසාන වශයෙන් නාට්‍ය ලෝකයේ යතාර්ථවාදී නාට්‍යයේ පියා සැළකෙන හෙන්රික් ඉබ්සන් කියූ වැකියකින් ලිපිය අවසන් කරමි.

''යම් කිසි රචකයෙකු තම සිතට දැනෙන දේ ප්‍රේක්ෂකයාට හෝ කියවන්නාඑ එපරිද්දෙන් ම ඉදිරිපත් කරන්නට හැකි නම් ඔහු දක්ෂ රචකයේකු වේ''


ඔබගේ සියලු **බදු** සහ
**ගිණුම් කටයුතු** සඳහා

**JOEY S. SANTOS & ASSOCIATES**

Public Accountants / Registered Tax Agent
ABN: 44 114 687 053

Refunds within 14 days

**Services**
- Individual/BusinessTax Returns(ELS)
- Accounting/Bookkeeping
- Preparation of Business Activity Statements (BAS)
- Audit of Non-For-Profit Organization and Self-Managed Superannuation Funds
- Personal Service and Advice



ශ්‍රී ලාංකික
ඔබට
සුහද සේවය

**L. A. Dayananda Wimalasiri**
B.Com, M.Com, MBus, Adv.Dip. Accounting, PNA
Accountant

**Office**
63B, Springs Road,
Clayton South, VIC 3169
TP: 9558 6803-4
Fax: 9540 0691

**After Hours**
7 Whitton Court
Rowville, VIC 3178
TP/Fax: 9755 7400
Mobile: 0402 846 676

E-mail: dayananda@iprimus.com.au

NIA NATIONAL INSTITUTE OF ACCOUNTANTS
PNA